## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

### අති විශේෂ

අංක 1975/47 - 2016 ජූලි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2016.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x).

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක පී. වී. 62877 සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් එකී පනත යටතේ සාදනු ලැබූ 2015 දෙසැම්බර් මස 07 වැනි දින අංක 1944/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''අලෙවිකරණය පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය'' යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම පහත නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**කොන්දේසි**

(මෙහි මින්මතු ''ආයතන'' යනුවෙන් සඳහන් කරනු ලබන) හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් :-

(1) අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 3 ක් සමගින් වූ අවම විශ්වවිද්‍යාල ඇතුළත්වීමේ යෝග්‍යතාවය හෝ ලන්ඩන් (උසස් පෙළ) විභාගයේ එක් වරක දී සාමාන්‍ය සාමාර්ථ 3 ක් යන අවම සුදුසුකම් අනුගමනය කරනු ලැබිය යුතු ය.

(2) තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් වනවිට, පහත දැක්වෙන නියමයන්ට එකඟව ක්‍රියා කළ යුතු ය :-

ආයතනය විසින්, පහත දැක්වෙන දෑ නිශ්චිත බලධරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය :-

(අ) මෙම නියමය පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට විදේශ විභාග ප්‍රතිඵල සමාන වන්නේ කෙසේ දැයි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

1A - PG 3009 — 507 (2016/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට පෙරාතුව අදාළ පර්යේෂණ, පශ්චාත් උපාධි (පී එච් ඩී), (එම් ෆිල්) සුදුසුකම් සහිත තැනැත්තන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් ඇති කළ යුතු ය.

(ඇ) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට පෙරාතුව ප්‍රායෝගික වැඩසටහන්, අදාළ සියලු මොඩියුල සඳහා පර්යේෂණාගාර පත්‍ර සම්පූර්ණ කළ යුතු ය.

(ඈ) මෙම නියමය පළ කරනු ලබන දින සිට මාස හයක් ඇතුළත අනාගත අවශ්‍යතාවලට සරිලන විද්‍යාගාර පහසුකම් ප්‍රවර්ධනය කළ යුතු ය.

*උපලේඛනය*

| "*I වන තීරය* *උපාධිය* | *II වන තීරය* *උපාධි සඳහා කෙටි යෙදුම* |
|---|---|
| අධ්‍යාපනවේදී | බී ඊ ඩී |
| තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය/තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය, | බී එස් සී අයි ටී/බී එස් සී ගෞරව (අයි ටී)'' |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

07 - 1128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.